**ප්‍රවාහන ව්‍යාපෘති සූදානම් කිරීමේ පහසුකම් ව්‍යාපෘතිය (උතුරු කොළඹ වරාය සංවර්ධනය සම්බන්ධයෙන් සිදු කරනු ලබන ශක්‍යතා අධ්‍යයනය සඳහා උපදේශන සේවා ව්‍යාපෘතිය) - 2021**

---

ප්‍රවාහන ව්‍යාපෘති සූදානම් කිරීමේ පහසුකම් ව්‍යාපෘතියේ (උතුරු කොළඹ වරාය සංවර්ධනය සම්බන්ධයෙන් සිදු කරනු ලබන ශක්‍යතා අධ්‍යයනය සඳහා උපදේශන සේවා ව්‍යාපෘතිය) 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2016 ඔක්තෝබර් 28 දින එළඹි අංක 3425-එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ 2.09 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ව්‍යාපෘති ගිවිසුම සහ ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව, වරාය සහ නාවික කටයුතු අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ශ්‍රී ලංකා වරාය අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ අරමුණ වනුයේ ප්‍රමුඛතා ප්‍රවාහන ව්‍යාපෘතිවල සූදානම වැඩිදියුණු කිරීම වන අතර ණය ගිවිසුමේ ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව, ජාතික වරාය ප්‍රධාන සැලැස්ම අනුගමනය කරමින් වරාය පහසුකම් සංවර්ධනය සඳහා සූදානම් වීමට ශ්‍රී ලංකා වරාය අධිකාරියට සහාය වේ. ණය ගිවිසුමට අනුව, එකඟ වූ මුළු ණය මුදල එස්ඩීආර් මිලියන 17.47ක් වූ අතර ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව, මෙම සංරචකයේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 729.65 කට සමාන එජඩො මිලියන 5ක් වන අතර ඉන් රු.මිලියන 645.01කට සමාන එජඩො මිලියන 4.42ක් ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යකරණය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2016 ඔක්තෝබර් 28 දින සිට මාස තුනකට පසුව ආරම්භ කිරීමට නියමිතව තිබුණද, සංරචකයේ ක්‍රියාකාරකම් 2018 වර්ෂයේ දී ආරම්භ කර තිබුණු අතර 2022 දෙසැම්බර් 31 දින වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි.

## 1.3 මතය

------

ව්‍යාපෘතියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි වියදම් ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

## 2. භෞතික කාර්යසාධනය

### 2.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳව භෞතික ප්‍රගතිය

උතුරු කොළඹ වරාය සංවර්ධන ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යනය උපදේශන සේවාව සහ එහි සවිස්තරාත්මක ඉංජිනේරු සැලැස්ම 2020 දෙවන කාර්තුව වනවිට නිමකිරීමට සැලසුම්කර තිබුණි. කෙසේවෙතත්, ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදය හේතුවෙන් කොන්ත්‍රාත්තුව 2020 පෙබරවාරි 24 දින AECOM Infrastructure and Environment UK Limited වෙත පිරිනමා තිබුණු අතර එම දින සිට මාස 15ක් ඇතුළත කොන්ත්‍රාත්තුව නිම කිරීමට සිදුවිය. සැලසුම් කළ පරිදි කොන්ත්‍රාත්තුව යටතේ කටයුතු 2021 මැයි 23 දින වන විට නිමකර නොතිබුණු අතර 2022 ජුලි 31 වන විට දීර්ඝ කිරීම් දෙවතාවක් ලබාදී තිබුණි. 2022 මාර්තු 31 දිනට උපදේශන සේවා කොන්ත්‍රාත්තුවේ සමස්ථ ප්‍රගතිය සියයට 85ක් වූ අතර කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් කෙටුම්පත් පාරිසරික බලපෑම් තක්සේරු වාර්තාව, කෙටුම්පත් ශක්‍යතා අධ්‍යන වාර්තාව සහ අවසන් වාර්තාව 2022 මාර්තු 31 දින දක්වා නිමකර නොතිබුණි. එහි ප්‍රතිපලයක් ලෙස අපේක්ෂිත ප්‍රගතිය අත්කර ගැනීමට නොහැකි විය.

## 2.2 උපයෝජිත සම්පත්

| විගණන ගැටලුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| වරාය සහ නාවික කටයුතු අමාත්‍යාංශයේ වාර්ෂික අයවැය මගින් සමාලෝචිත වර්ෂය සඳහා ශ්‍රී ලංකා රජයේ සහ ආසියානු සංවර්ධන බැංකු වියදම් යටතේ ව්‍යාපෘති වියදම් සඳහා එකතුව රු.මිලියන 380ක් වෙන්කර තිබුණි. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය තුළදී රු.මිලියන 287ක් පමණක් වියදම් කර තිබුණි. | උපදේශක විසින් 2021 සැප්තැම්බර් සිට 2021 දෙසැම්බර් දක්වා කරන ලද කටයුතුවලට ඉල්ලීම් නොකිරීම හේතුවෙන් 2021 වර්ෂය සඳහා අපේක්ෂිත මූල්‍ය ප්‍රගතිය ළඟාකර ගැනීමට නොහැකි විය. | වර්ෂය තුළ කළ හැකි කටයුතු පිළිබඳ සලකමින් වාර්ෂික ඇස්තමේන්තු පිළියෙල කළ යුතු අතර කළමනාකරණය මූල්‍ය ඉලක්ක ළඟාකර ගැනීමට පියවර ගත යුතුය. |

## 2.3 පද්ධති හා පාලනයන්

| විගණන ගැටලුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් සමාලෝචිත වර්ෂය සඳහා වගකීම් නියම කරමින් ක්‍රියාකාරකම්, ඉලක්කගත කාලසීමාව, භෞතික හා මූල්‍ය ඉලක්ක ඇතුළත් කරමින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | සවිස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් ඉදිරියේදී පිළියෙල කිරීමට එකඟ විය. | සමාලෝචිත වර්ෂය සඳහා ඉලක්ක සහ අත්පත්කර ගැනීම් මැනීමට හැකි පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතුය. |